# සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දේශපාලන විද්‍යාව - 12 ශ්‍රේණිය


සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය

**තිළිණ ජයවර්ධන** - ර/මල්වල මහා විද්‍යාලය


### 6 වන සතිය

**01.** දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය හා සම්බන්ධ නො වන්නේ,

**(1)** මෙය මුලින් ම භාවිත වූයේ 18 වන සියවසයේ ය.
**(2)** මෙම චින්තනයේ ප්‍රධාන වූ චින්තකයෙකු වූයේ තෝමස් මැල්තස් ය.
**(3)** මෙහි දී සමාජ සැකැස්මක් මූලිකව තල දෙකක් දක්වයි.
**(4)** ඇඩම් ස්මිත් ද ප්‍රධාන චින්තකයෙකු වේ.
**(5)** මෙය මුලින් ම භාවිත ව ඇත්තේ 20 වන සියවසයේය. (...)

**02.** ජාතිකවාදය අදාළ නොවන්නේ,

**(1)** විසිවැනි සියවසයේ මෙන් ලෝකය පුරා පැවති ප්‍රබල මතවාදයකි.
**(2)** පළමුවෙන් යුරෝපය තුළ මතු විය.
**(3)** පසුව ආසියානු, අප්‍රිකානු, ලතින් ඇමරිකානු රටවල ව්‍යාප්ත විය.
**(4)** දහවැනි සියවසයේ පටන් ලෝකය පුරා පැවති මතවාදයකි.
**(5)** නූතන ජාතික රාජ්‍ය හැඩගැසී ඇත්තේ ජාතිකවාදය විසින් ජාතික හා රාජ්‍ය පරිකල්පනය අනුවයි. (...)

**03.** දේශපාලන පක්ෂවලට අදාළ නැති ප්‍රකාශය වන්නේ,

**(1)** ආණ්ඩු බලය ලබා ගැනීම අරමුණ වේ.
**(2)** මැතිවරණවලට සහභාගී වේ.
**(3)** දේශපාලන නායකයන් පුහුණු කරයි.
**(4)** සාමාජික කාඩ්පත හිමි සමාජිකයන්ගෙන් සමන්විතය
**(5)** ආණ්ඩු බලය වෙනුවෙන් සටන් නො කරයි. (...)

**04.** බලපෑම් කණ්ඩායම්වලට අදාළ නොවන්නේ,

**(1)** ලොබි කණ්ඩායම් ලෙස ද හඳුන්වයි.
**(2)** රජයේ ප්‍රතිපත්ති, තීරණ ආදියට බලපෑම් කිරිම සිදු කරයි.
**(3)** බලපෑම් කණ්ඩායම් පුරවැසි කණ්ඩායම් විය හැකි අතර එසේ නොවීම ද හැකි ය.
**(4)** බලපෑම් කණ්ඩායම් යනු පුරවැසි කණ්ඩායම් පමණක් වේ.
**(5)** ආණ්ඩුවේ තීරණවලට බලපෑම් කරයි. (...)

**05.** ස්වාධිපත්‍යය හා සම්බන්ධ නො වන්නේ,

**(1)** රාජ්‍ය සතු අධිකාරී බලය මෙයින් අදහස් වේ.
**(2)** ස්වාධිපති බලය රාජ්‍යයට පමණක් හිමි වේ.
**(3)** රාජ්‍යයට හැර ස්වාධිපති බලය ආණ්ඩුවට ද හිමි වේ.
**(4)** නීති කඩ කරන්නන්ට මෙ මගින් දඬුවම් ලබා දිය හැකිය.
**(5)** එය මගින් අන් අයට අණ දෙන එහෙත් අණ නොලබන බලයකි. (...)

**06.** දේශපාලන විද්‍යාව යනු,

**(1)** සමාජ ජීවිතයේ ප්‍රධාන පැතිකඩක් වේ.
**(2)** ක්‍රි.පූ. 4 වන සියවසයේ ආරම්භ විය.
**(3)** දේ. ශාස්ත්‍රය ලෙස හැදැරීම පිළිබඳ දීර්ඝ ඉතිහාසයක් තිබේ.
**(4)** ස්වභාවික විද්‍යාවක් සමග සම්බන්ධ වේ.
**(5)** දේශය පාලනය කිරීම වේ. (...)

**07.** සමාජීය විද්‍යාත්මක ප්‍රවේශයේ උපකරණවලට අදාළ නොවන්නේ,

**(1)** සිද්ධි අධ්‍යනය **(2)** මතවාද
**(3)** ප්‍රශ්නාවලි **(4)** සහභාගීත්ව පරීක්ෂණ
**(5)** සම්මුඛ සාකච්ඡා (...)

**08.** ස්ත්‍රීවාදී ප්‍රවේශය ආරම්භ වීමට හේතුවක් නොවන්නේ,

**(1)** ස්ත්‍රීන් දේශපාලන වශයෙන් කොන් කිරීම.
**(2)** ස්ත්‍රී විමුක්තිය සඳහා වන සටන් පාඨ ඇතිවීම.
**(3)** ස්ත්‍රී කේන්ද්‍රීය වූ සමාජයක් ගොඩනගා තිබීම.
**(4)** පුරුෂාධිපත්‍ය විසින් ස්ත්‍රීන් පීඩනයට පත් කිරීම.
**(5)** ස්ත්‍රී පුරුෂ ශ්‍රම විභජනය පිළිබඳ අන්ත දෙකක් තිබීම. (...)

**09.** පෞර රාජ්‍යයට සම්බන්ධ විෂය කාරණාවලට අයත් නොවන්නේ,

**(1)** රාජ්‍යයේ ස්වභාවය **(2)** රාජ්‍යයේ අරමුණ
**(3)** රාජ්‍ය පාලන ක්‍රම **(4)** පුද්ගල සාරධර්ම
**(5)** පාලකයාගේ ගතිගුණ හා කුසලතා (...)

**10.** දේශපාලනය හැදැරීම යන්නට අදාළ නොවන්නේ,

**(1)** මැතිවරණ ව්‍යාපාර
**(2)** ආණ්ඩුවේ ප්‍රතිපත්ති
**(3)** මැතිවරණවලට සහභාගී වීම.
**(4)** යුද්ධය හා සාමය
**(5)** අන්තර්ජාතික සබඳතා හා ගැටුම් (...)

**11.** ආණ්ඩුව යන්න අදාළ නොවන්නේ,

**(1)** රාජ්‍යයේ ස්වාධිපත්‍ය ක්‍රියාත්මක කරන සංවිධානය ආණ්ඩුව වේ.
**(2)** ඒ අනුව ආණ්ඩුවට ද ස්වාධිපති බලය ඇත.
**(3)** ආණ්ඩු වර්ග විවිධාකාර වන අතර විවිධ ආණ්ඩු නිදසුන් වේ.
**(4)** පාර්ලිමේන්තු ආණ්ඩු හා ජනාධිපති ආණ්ඩු නිදසුන්වේ
**(5)** ආණ්ඩුව විසින් රාජ්‍යයේ බලය ක්‍රියාත්මක කරයි. (...)

12. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයට අදාළ වන්නේ,
(1) සීමිත රාජ්‍යය පිළිබඳ සංකල්පය ලිබරල්වාදයේ මූලික සංකල්පයකි.
(2) ඒකාධිපති පාලනය මෙහි විශේෂ ලක්ෂණයකි.
(3) ලිබරල්වාදය මගින් රාජ්‍ය සහ ජාතිය සර්වසම තත්වයට පත් කරයි.
(4) "රාජ්‍ය සර්ව බලධාරී සංවිධානය වේ" මෙහි නිර්වචනයකි.
(5) රාජ්‍යයේ බලය උත්තරීතර වේ. අසීමිත වේ. (...)

13. "යටත් විජිත රාජ්‍ය" අදාළ නොවන්නේ,
(1) මෙම රාජ්‍ය ඓතිහාසික වශයෙන් වර්ධනය වූයේ 16 වැනි සියවසයේ ය.
(2) 1815 දී මුළු ලංකාව ම බ්‍රිතාන්‍යයන්ගේ පාලනයට ගත්හ.
(3) යුරෝපීය නොවන සමාජවල වර්ධනය වූ රාජ්‍ය මාදිලියකි.
(4) මෙය මධ්‍යගත රාජ්‍ය තන්ත්‍රයක් මත සකස් වූවක් විය.
(5) මෙය ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් විය. (...)

14. රාජ්‍ය සහ ආණ්ඩුව අතර සබඳතාවලට අදාළ නොවන්නේ,
(1) කේන්ද්‍රීය හා මූලික දේශපාලන ආයතන වේ.
(2) අනෙක් දේශපාලන ආයතනවල ප්‍රභවය සිදු වන්නේ රාජ්‍ය හා ආණ්ඩුව මගිනි.
(3) රාජ්‍යයේ අධිකාරී බලය ක්‍රියාත්මක කරන එක් ආයතනයක් ආණ්ඩුව වේ.
(4) රාජ්‍යයේ බලතල ක්‍රියාත්මක කරන ප්‍රධානතම නියෝජිතයා ආණ්ඩුව වේ.
(5) රාජ්‍යයේ ස්වාධිපති බලය ආණ්ඩුව බුක්ති විඳී. (...)

15. විද්‍යාත්මක න්‍යායය යටතේ පැවැති න්‍යායික ධාරාවක් නොවන්නේ,
(1) ලිබරල් දේශපාලන න්‍යායය.
(2) සමූහාණ්ඩුවාදී දේශපාලන න්‍යායය.
(3) ෆැසිස්ට්වාදී දේශපාලන න්‍යායය.
(4) ස්ත්‍රීවාදී දේශපාලන න්‍යායය.
(5) මාක්ස්වාදී දේශපාලන න්‍යායය. (...)

16. රාජ්‍යය පිළිබඳ වැරදි ප්‍රකාශය වන්නේ,
(1) රාජ්‍යය යනු සමාජයක් පාලනයකිරීමට නිර්මාණය වූ බල ව්‍යුහවලත්, ආයතනවලත් එකතුවකි.
(2) රාජ්‍යයේ කාර්යයන් සම්ප්‍රදායික ව ප්‍රධාන ක්ෂේත්‍ර 3 කි
(3) රාජ්‍යයේ වර්ගීකරණයට වඩාත රාජ්‍යයේ කාර්යය-භාර්යය පුළුල් හා සංකීර්ණ වේ.
(4) නීති සම්පාදනය, නීති අර්ථකථනය රාජ්‍යයට අයත් කර්යයක් නොවේ
(5) රාජ්‍යය රාජ්‍යයේ ආරක්ෂාවට එල්ල වන තර්ජන මැඩ පවත්වයි. (...)

17. ඇරිස්ටෝටලියානු අර්ථයට අදාළ වන්නේ,
(1) මෙම අර්ථය ප්ලේටෝ ඉදිරිපත් කර ඇත.
(2) රාජ්‍යයට වඩා අනෙකුත් සමාගම් උසස් වේ.
(3) politics කෘතිය මේ හා සම්බන්ධ වේ.
(4) අනෙකුත් සමාගම් රාජ්‍ය යේ අරමුණු වෙනුවෙන් කැප වේ.
(5) රාජ්‍යය සිදු කරන්නේ දේශපාලඥයින්ගේ අරමුණු වෙනුවෙන් කැප වීමයි. (...)

18. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයේ ඉතාම වැදගත් මූලධර්ම වන්නේ,
(A) මැතිවරණ වල දී තීරණය කරන ලද පාර්ලිමේන්තුව නියෝජනය කරන දෙශපාලන පක්ෂවල ශක්තිය මත ආණ්ඩුව පිහිටුවීම.
(B) ආණ්ඩුව පාර්ලිමේන්තුවේ විශ්වාසය මත රඳා පවතින බැවින් පාර්ලිමේන්තුවට වගකීමට ආණ්ඩුව බැඳී සිටීම.
(C) විධායකයේ සාමාජිකයින් සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවේ බහුතර ආසන සංඛ්‍යාවක් හිමි පක්ෂයේ සාමාජිකයින් ඇතුරෙන් පත් කිරීම.
(D) විධායකය සාමූහික එකක් වීම.
(E) ආණ්ඩුවේ නායකයා වන අගමැති රාජ්‍ය නායක ධූරය හා ප්‍රධාන අණදෙන නිලධාරී තනතුර දැරීම.
(1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE (...)

19. 'මැක් අයිවර්' විසින් රජය සම්බන්ධයෙන් පවතින අර්බුධයේ ස්වරූපය දැක්වීමට ඉදිරිපත් කළ අදහස් වන්නේ,
(A) රාජ්‍ය බල සංවිධානයකි.
(B) රාජ්‍ය සුහසාධක සංවිධානයකි.
(C) රාජ්‍ය නෛතික සංවිධානයකි.
(D) රාජ්‍ය දේශපාලඥයිගේ සංවිධානයකි.
(E) රාජ්‍ය සාමාජීය නිර්මාණයකි.
(1) ABCD (2) BCDE (3) ABDE
(4) ACDE (5) ABCE (...)

20. ජනාධිපති ආණ්ඩු ක්‍රමය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය වන්නේ,
(A) මෙම ආං ක්‍රමයේ තනි විධායකයක් පැවතුණි.
(B) විධායකය අස්ථාවර වේව්
(C) ආණ්ඩුව සාමූහික මණ්ඩලයක් විය.
(D) විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳි සිටී.
(E) ජනාධිපති දෝෂාභියෝගයකින් ඉවත් කළ හැකිය.
(1) ABC (2) A හා E (3) BCD
(4) A හා D (5) ACDE (...)

21. නිරාගමිකවාදය හා සම්බන්ධ නිවැරදි සහගත ප්‍රකාශය වන්නේ,
(A) නිරාගමිකවාදය යනු ආගම සහ දේශපාලනය මිශ්‍ර නොකිරීමයි.
(B) ආගම හා දේශපාලනය ස්වාධීන ක්ෂේත්‍ර දෙකක් ලෙස සලකයි.
(C) මෙය 18 , 19 සියවස්වල ආරම්භ වූවකි.
(D) ලිබරල්වාදය හා සමාජවාදය නිරාගමිකවාදය සමඟ සම්බන්ධ විය.
(E) සමාජවාදයට අනුව ආගමක් පැවතීම රාජ්‍යනේ අවසරයෙන් තොරව පැවතිය හැකිය.
(1) ABCD (2) BCDE (3) ACDE
(4) ABCE (5) ABDE (...)